**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

Article 12(1) 14(2)

මගේ අංකය / எனது இல. / My No. }    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2019 - 08 - 08

---

පැමිණිලි පාර්ශවය : පී.ඩබ්. ජගත් මහතා,
40/4, දොරගමුව,
වත්තේගම.

වගඋත්තරකාර පාර්ශවයන්:

1. ලේකම්,
නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
ත්‍රිකුණාමලය .

2. ලේකම්,
නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශය,
ත්‍රිකුණාමලය .

3. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශය,
ත්‍රිකුණාමලය .

4. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
අම්පාර.

<u>පැමිණිලි අංකය : **HRC/AM/117/16**</u>

**පැමිණිල්ලේ සැළකිරීම :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින්, තමා නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු වශයෙන් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයාගේ නියෝග මත අම්පාර නගර සභාවට



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@gmail.com

අනුයුක්තව සේවය කරන ලද බවත්, 2015/01/28 දිනැති අංක AM/RDHS/E3/PHI/7 දරණ (වාර්ෂික ස්ථාන මාරු 2015) ලිපියෙන් තමන්ට ස්ථාන මාරුවීම් ලබා දුන් බව දන්වා තිබුනද ඒ සම්බන්ධව නගර සභාව දැනුවත් කර නොතිබීම මත නගර සභාවේ සභාපති හා ලේකම් පිළිවෙලින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක හා වෛද්‍ය නිලධාරී සැලසුම් වෙත අම්/නස/ආලි/69/(21)111 හා අම්/නස/ආලි/ස.ශ්‍රේණි දරණ ලිපි යොමු කළ බවත්, එම ලිපි මඟින් ස්ථාන මාරු වීම් සඳහා තමා මුදා හැරීමේදී පරිපාලන ගැටලු රාශියක් මතු වෙමින් පැවති බව පැහැදිලි වූ බවත් සඳහන් කර ඇත. එම ගැටළු නිරාකරණය කර නිසි උපදෙස් තමාට ලබා දීමේ වගකීම පරිපාලනය හා බැඳුණු කර්තව්‍යයක් බවත්, එය නිසි පරිදි ඉටු නොවූ බවත්, අනතුරුව ඒ පිළිබඳව කිසිදු පැහැදිලි කිරීමකින් තොරව 2015/11/20 දිනැති (වාර්ෂික ස්ථාන මාරු 2015) හිසින් තමාට ස්ථාන මාරු නියෝග නිකුත් වූ බවත්, එම නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා 2015/11/02 දින ලේකම්, නගර සභාව විසින් තමා නගර සභා සේවයෙන් නිදහස් කළ බවත් සඳහන් කර ඇත.

2015/11/03 දින තමා අසනීප බැවින් නිවාඩු ඉල්ලා විදුලි පුවතක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අම්පාර වෙත යොමු කළ බවත් එසේ තිබියදී 2015/11/04 දිනැතිව අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක අංක E07/PF/PHI/041 දරණ "තනතුර අත් හැර යාමේ" නිවේදනය නිකුත් කරමින් තමා තනතුර අත්හැර ගියා සේ සලකා කටයුතු කරන බව දැනුම් දුන් බවත් සඳහන් කර ඇත. අනතුරුව ඒ පිළබඳව තමා 2016.01.25 දින නැවත සේවයේ පිහිටවීම කරන ලෙස අභියාචනාවක් අම්පාර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත බාර දුන් බවත් ඉන්පසුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (පළාත් ආණ්ඩුකාර අනුමැතිය ඇති) 2016/08/12 ලිපිය මඟින් නැවත සේවයේ පිහිටුවීම සිදු කළද,

01. අම්පාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට හෝ අම්පාර නගර සභාවට වසර 05 ක් යනතුරු පත් නොකිරීම හා

02. සේවය හැර ගිය දින සිට නැවත සේවයට වාර්තා කරන දින දක්වා කාලය වැටුප් රහිත නිවාඩු සේ සැලකීම

යන කොන්දේසි වලට එකඟ වන්නේ නම් දින 03 ක් ඇතුළත අම්පාර ප්‍රදේශීය සේවා අධ්‍යක්ෂක කාර්යාලයට සේවයට වාර්තා කරන ලෙස දන්වා ඇති බවත් අසනීප නිවාඩු ඉල්ලා තිබියදී සේවය අත්හැර යාමේ නිවේදනය නිකුත් කිරීම නීත්‍යානුකූල නොවන බැවින් සියලු අයිතිවාසිකම් සහිතව හිඟ වැටුප් ද ලබා දෙමින් සේවයේ ප්‍රතිෂ්ඨාපනය කර දෙන ලෙසත් ඉල්ලා ඇත.

එසේම 2014 වර්ෂයේදි ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් නගර සභාවේ සේවයේ යෙදි සිටියදි 2014 ජුනි මස සිට 2015 මාර්තු මස දක්වා වැටුප් ගෙවීම් නතර කළ බවත්, ඒ පිළිබඳව තමා

කළ ඉල්ලීම අනුව පරීක්ෂණ වලින් අනතුරුව වැටුප් ගෙවීමට තීරණය කළද, එම වැටුප් මේ දක්වා ලැබී නොමැති බවත්, වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-**

පැමිණිලිකරු අම්පාර සෞඛ්‍ය නිලධාරි කාර්යාලයට අනුයුක්තව සේවයේ යෙදුණු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු බවත්, ඔහුට 2014 වර්ෂයට අදාළව නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ අංක EP/21/CC/Ann.Tra/2014 හා 2013.11.20 දිනැති ලිපියෙන් දමන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වෙත ස්ථාන මාරු නියෝගයක් ලබා දී තිබූ බැවින් අම්පාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙත තමාගේ අංක AM/RDHS/E3No/04 හා 2014.05.27 දිනැති ලිපියෙන් පැමිණිලිකරුවද පිටපත් සහිතව දමන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වෙත මුදාහැරීමට කටයුතු කරන ලෙස දැන්වූ බවත්ය. ඒ අනුව අම්පාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ස්ථානමාරු 2014.06.02 ලිපියෙන් ඔහුව දමන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වෙත නිදහස් කර ඇතත්, එම නියෝග සියල්ල නොතකා හැරීම ආයතන සංග්‍රහයේ XIVII පරිදි එය විෂමාචාරයක් බැවින් ඔහුගේ වැටුප් ගෙවීම තාවකාලිකව අත්හිටුවා පරීක්ෂණයකින් පසුව නැවත ගෙවීම් කටයුතු කර ඇති බවත් දන්වා ඇත.

එසේම ඉන් අනතුරුව 2015 වර්ෂයට අදාළ නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ අංක EP/21/CC/Ann.Tra/2015 හා 2014.11.17, 2015.01.20 දිනැති ස්ථානමාරු නියෝග ලැයිස්තු මඟින් පැමිණිලිකරු ලාහුගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට ස්ථාන මාරුකර තිබූ බවත්, එම මාරුවීම් නියෝග ක්‍රියාත්මක කරන ලෙස තමා AM/RDHS/E3/PHI/04 හා 2015.01.28 දිනැති ලිපිය මඟින් අම්පාර සෞඛ්‍ය සේවා නිලධාරි වෙත දැන්වූ බවත් සඳහන් කර ඇත.

එසේම 2015.10.20 දිනැති AM/RDHS/E3/PHI/04 (වාර්ෂික ස්ථානමාරු 2015) ලිපියෙන් පැමිණිලිකරු හට ලාහුගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වෙත ලැබී ඇති ස්ථානමාරු නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා ඔහු මුදා හරින බව දන්වා ඇත.

කෙසේ වෙතත් වාර්ෂික ස්ථාන මාරු නියෝග යටතේ නව සේවා ස්ථානයේ සේවය භාර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් 2015.11.04 වන දින සිට අම්පාර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා E07/PF/PHI/04 දරණ ලිපිය මඟින් 2015.11.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවය අත්හැර යාමේ නිවේදනය නිකුත් කර ඇති බවත්, එය නිකුත් කළ දින පැමිණිලිකරු අසනීප යැයි සඳහන් කරමින් 2015.11.03 යොමුකළ විදුලි පුවතක් තමා වෙත 2015.11.04 දින ලැබුණු බවත් සඳහන් කර ඇත.

මෙම පැමිණිලිකරු 2015.11.24 දිනැතිව නැවත තමා සේවයේ පිහිටුවන ලෙස ඉල්ලුම් කර සේවායෝජකයා මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කර ඇති බවත් දන්වා ඇත. එකී අභියාචනය මත ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුවද අධ්‍යයනය කර 2016.08.21 පැවති නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදුව ඉහල බලධාරීන්ගෙන් මෙම පැමිණිලිකරුට යම් අසාධාරණයක් සිදුව ඇතැයි යන නිගමනයට පැමිණ නැවත සේවයේ පිහිටුවීමෙන් වසර 05 ක් යන තුරු අම්පාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය හෝ අම්පාර නගර සභාවට අනුයුක්ත නොකළ යුතුය යන කොන්දේසිය යටතේ නැවත සේවයේ පිහිටුවීම නිර්දේශ කරන ලද බවත් දන්වා ඇත. ඒ සඳහා පළාත් ආණ්ඩුකාර අනුමැතිය ලැබී ඇති බවද දන්වා ඇත. ඒ පිළිබඳව සේවායෝජකයා වෙත දැන්වීමෙන් අනතුරුව ඔහු 2016.08.12 දිනැති ලිපියෙන් එය පැමිණිලිකරුට දන්වා ඇති අතර 2016.08.31 දිනැති ලිපියෙන් 2016.09.09 දිනට පෙර නැවත සේවයට වාර්තා කළ යුතු බවට සිහිකැඳවීමක්ද කර ඇති නමුත් ඔහු මේ දක්වා සේවයට වාර්තා කර නොමැති බවත් කොමිෂන් සභාව වෙත දන්වා ඇත. කෙසේ වෙතත් කොමිෂන් සභාව හමුවේ මෙම පැමිණිල්ල විභාග කරන අවස්ථාව දක්වාම පැමිණිලිකරු සේවයට වාර්තා කර නොමැති බව වැඩිදුරටත් කොමිෂන් සභාවට දන්වා ඇත.

විමර්ශනයේදි අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු 1991.02.01 දින මහජන සෞඛ්‍ය පරීක්ෂක ලෙස පත්වීම් ලබා අම්පාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය යටතේ අම්පාර නගර සභාවට අනුයුක්තව සේවය කර ඇති අතර, 2015 වර්ෂයට අදාල නැගෙනහිර සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂක අංක EP/21/CC/Ann/Tra/2015 හා 2014.11.27, 2015.01.20 දිනැති ස්ථාන මාරු නියෝග ලැයිස්තු මගින් ලාහුගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට ස්ථාන මාරු තර ඇති බවත්, 2015 වාර්ෂික ස්ථාන මාරු යටතේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂකගේ AM/RDHS/E3/PHI/04 අංක දරණ 2015.10.20 දිනැති වාර්ෂික ස්ථානමාරු ලිපිය අනුව අම්පාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ සෞ.වෛ.නි/පොදු/ස්ථාන මාරු 13 හා 2015.11.02 දිනැති ලිපිය මගින් පැමිණිලිකරු ලාහුගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සේවයට වාර්ථා කිරිම සඳහා පැමිණිලිකරු අම්පාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලීය සේවයෙන් නිදහස් කර ඇති බවත් අනාවරණය වේ. එසේම 2015.11.02 දිනැති අම්පාර නගර සභාවේ ලේකම්ගේ අම්/නස/ආලි/69(21)111 අංක දරණ ලිපිය ස්ථානමාරු නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා නගර සභා සේවයෙන් නිදහස් කර ඇති බවද අනාවරණය වේ.

2015.11.03 දින පැමිණිලිකරු තමා අසනීප බව දන්වා අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත විදුලි පුවතක් යොමු කර ඇති බවත් වාර්ෂික ස්ථාන මාරු යටතේ නව සේවා ස්ථානයේ සේවය භාර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් 2015.11.04 වන දිනැතිව සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂකගේ අංක E

07/PT/PHI/04 දරණ ලිපිය මඟින් 2015.11.04 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පැමිණිලිකරු වෙත සේවය අතහැර යාමේ නිවේදනය නිකුත් කර ඇති බවත් අනාවරණය වේ.

පැමිණිලිකරු නැවත සේවය ඉල්ලා අභියාචනයක් 2015.11.24 දිනැතිව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක හා නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක මඟින් නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා ලේකම් වෙත ඉල්ලීමක් කර ඇති අතර එය නැගෙනහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක EP/04/EO/02/12 හා 2016.03.29 දිනැති ලිපිය මඟින් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති බව අනාවරණය වේ.

ඉහත අභියාචනය අනුව නව සේවා ස්ථානයට නිදහස් කිරීමෙන් පැය 24 ක් ගත වීමට ප්‍රථම මෙම පැමිණිලිකරු තමන්ට අසනීප බව විදුලි පුවතක් මඟින් දන්වා තිබියදීත් සේවය අත්හැර යාමේ නිවේදනය නිකුත් කර ඇති බව අවධානයට ලක් කර එම අභියාචනය 2016.06.21 පැවති නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඉහළ බලධාරීන්ගෙන් මෙම පැමිණිලිකරුට යම් අසාධාරණයක් සිදුව ඇතැයි යන නිගමනයට පැමිණ නැවත සේවයේ පිහිටවීමෙන් වසර 05 ක් යනතුරු අම්පාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට හෝ නගර සභාවට අනුයුක්ත නොකල යුතුය යන කොන්දේසිය යටතේ නැවත සේවයේ පිහිටවීමට නිර්දේශ කර ඇති බවත් එම නිර්දේශ සඳහා නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත් අනාවරණය වේ.

ඉහත කොන්දේසිය යටතේ නැවත සේවයේ පිහිටවීමට අනුමැතිය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ EP/07/06/11 හා 2016.07.08 දිනැති ලිපිය මඟින් පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇති අතර, පැමිණිලිකරු නැවත සේවයේ පිහිටවන ලෙස පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ EP/21/EC/PHI/පාලන හා 2016.08.05 දිනැති ලිපියෙන් අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දන්වා ඇති බවත් ඒ අනුව අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ අංක AM/RDHS/ET/PF/PHI/04 හා 2016.08.12 දිනැති ලිපියෙන්,

I. අම්පාර සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයට හෝ නගර සභාවට වසර 05 ක් යන තුරු පත් නොකිරීම.

II. සේවය හැර ගිය දින නැවත සේවයේ පිහිටුවනු ලැබ සේවයට වාර්තා කරන දින දක්වා කාලය වැටුප් රහිත නිවාඩු සේ සැලකීම.

යන කොන්දේසි වලට තවදුරටත් එකඟ වන්නේ නම් ඉහත ලිපිය ලැබී දින 03 ක් ඇතුළත කාර්යාලයට වාර්තා කරන මෙන් දන්වා ඇති බව අනාවරණය වේ.

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ අම්පාර AM/RDHS/LOJ/PF/PHI/04 හා 2016.08.31 දින ලිපිය මඟින් පැමිණිලිකරුට 2016.09.09 දිනට ප්‍රථම සේවයට වාර්තා කරන ලෙසත් නොඑසේ නම් සේවයට වාර්තා නොකරන්නෙකු සේ සලකා කටයුතු කරන බවත් සිහිකැඳවීමක් කර ඇති බවත් අනාවරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභා නිර්දේශයේ ඇතුළත් නොවන සේවය හැර ගිය දින සිට නැවත සේවයේ පිහිටුවනු ලැබ නැවත සේවයට වාර්තා කරන කාලය දක්වා වැටුප් ගෙවීම පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කළ විමසීමේදී එම කාලය වැටුප් රහිත නිවාඩු ලෙස සැලකීමට උපදෙස් දීම මත එම කොන්දේසිය නැවත සේවයේ පිහිටුවීමේ ලිපියට ඇතුළත් කර ඇති බව අනාවරණය වේ.

නැවත සේවයේ පිහිටුවීමේ ලිපියේ සඳහන් පරිදි පැමිණිලිකරු කිසිදු කොන්දේසියකට එකඟත්වයක් දක්වා නොමැති බවද, ඒ සම්බන්ධයෙන් 2016.10.06 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල ගොනු කර ඇති බව අනාවරණය වේ.

කොමිෂන් සභාවේ අදාළ පැමිණිල්ල විභාග වෙමින් තිබියදී 2016.06.21 නිකුත් කර තිබූ "නැවත සේවයේ පිහිටවීමේ" රාජ්‍ය සේවා කොමිෂන් සභා නිර්දේශය 2017.03.30 වන දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත අවලංගු කර ආණ්ඩුකාරවරයා වෙත දැනුම් දී ඇති බවත්, පැමිණිලිකරුට සේවය හැරයාමේ නිවේදනය නිකුත් කිරීම මත 2014 ජුලි මස සිට 2015 මාර්තු මස දක්වා ගෙවීමට නියමිතව තිබූ වැටුප් ගෙවීමේ කටයුතු ද අත්හිටුවා ඇති බවත් අනාවරණය වේ.

නිගමනය :-

ඒ අනුව පැමිණිලිකරු නව සේවා ස්ථානයේ වැඩ භාර ගැනීම සඳහා අම්පාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් හා අම්පාර නගර සභාවෙන් නිදහස් කර ඇත්තේ 2015.11.02 වන දින වන අතර ඔහු 2015.11.03 වන දින තමා අසනීප බව දන්වා සේවා යෝජකයා වෙත විදුලි පුවතක්ද යොමු කර තිබියදී 2015.11.04 දින ඔහු වෙත සේවය අත්හැර යාමේ නිවේදනය නිකුත් කර ඇති බව නිරීක්ෂණය වන අතර අසනීප නිවාඩු ඉල්ලා විදුලි පුවතක් යොමුකර තිබියදී සේවය හැරයාමේ නිවේදනය නිකුත් කිරීම නීත්‍යානුකූල නොවන බව අනාවරණය වේ.

2016 07 08 දින දරණ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ත්‍රිකුණාමලයහි ලේකම් විසින් නිකුත් කොට ඇති ලිපියට අනුව පැමිණිලිකරු අම්පාර සෞඛ්‍ය වෛද්‍ය නිලදාරී කාර්යාලයට හෝ අම්පාර නගර සභාවට වසර 5 ක් යනතුරු පත්නොකළ යතුය යන කොන්දේසිය යටතේ නැවත සේවයේ පිහිටුවීමට නැගෙනහිර පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව ලේකම් සෞඛ්‍ය අමාත්‍යංශය නැගෙනහිර පළාත වෙත දැනුම් දී ඇත.

එසේ නමුත් 2016.08.12 දිනැතිව අංක AM/RDHS/E7/PF/PHI/04 ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ කාර්යාලය අම්පාර වෙතින් "නැවත සේවයේ පිහිටවීම" යන මැයෙන් යොමු වූ ලිපියෙන් පැමිණිලිකරු සේවයේ පිහිටුවීමේදි වසර 05 ක් යනතුරු අම්පාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට හෝ අම්පාර නගර සභාවට අනුයුක්ත නොකිරීමත්, පැමිණිලිකරු සේවය හැරගිය දින සිට නැවත සේවයට වාර්තා කරන දින දක්වා කාලය වැටුප් රහිත නිවාඩු සේ සැළකීමත්, යන කොන්දේසි වලට පැමිණිලිකරු එකඟවී ඇති බව හා තවදුරටත් එකඟ වන්නේ නම් දින 03 ක් ඇතුළත ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ කාර්යාලය වෙත වාර්තා කරන ලෙස දන්වා ඇත. පැමිණිලිකරු අදාළ කොන්දේසිවලට එකඟවී නොමැති බැවින් හා තවදුරටත් එකඟ නොවන බැවින් සේවයට වාර්තා නොකර තම මූලික අයිතිවාසිකම් කඩකර ඇති බව දන්වා කොමිෂන් සභාව වෙත පැමිණිලිකර ඇත.

එසේම පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීමේදි "රාජ්‍ය සේවා කොමිෂන් සභා නිර්දේශ නොමැති සේවය හැරගිය දින සිට නැවත සේවයේ පිහිටවනු ලැබ සේවයට වාර්තා කරන දින දක්වා කාලය වැටුප් රහිත නිවාඩු සේ සළකම්" යන කොන්දේසිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ කාර්යාලයෙන් නැවත සේවය පිහිටුවීමේ ලිපියට ඇතුළත් කිරීම පිළිබඳව විරෝධය පළ කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කිරීම සිදුකර ඇත. එම පැමිණිල්ල විභාග වෙමින් තිබියදි හා එම පරීක්‍ෂණ පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත්ව තිබියදිම පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීමට දී තිබූ නිර්දේශය 2017.03.30 වන දින අවලංගු කිරීම සිදුකර ඇත. ඒ අනුව පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කිරීම හේතුවෙන් නැවත සේවයේ පිහිටුවීම අවලංගු කර ඇති බව හැඟී යයි. ඒ අනුව,

01. පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීමට 2016.07.08 දිනැතිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබා දී තිබූ නිර්දේශය 2017.03.30 වන දින නැවත අවලංගු කිරීම.

02. ඔහු නැවත සේවයේ පිහිටුවීමේදි සේවය හැර ගිය දින සිට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් (සේවය හැරයාමේ චේතනාවක් නොතිබූ බව අනාවරණය වී තිබියදි) නැවත සේවයේ පිහිටුවීම මත සේවයට වාර්තා කරන දින දක්වා කාලය වැටුප් රහිත නිවාඩු ලෙස සැළකීමට

කටයුතු කිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(2) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට මෙම පරීක්ෂණයෙන් අනාවරණය තීරණය කරනු ලැබේ.

නිර්දේශය :-

01. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පරීක්ෂණයේදී පැමිණිලිකරු තුල සේවය අතහැරයාමේ කිසිදු අභිලාශයක් නොතිබී ඇති බව අනාවරණය වී ඇති බැවින් සේවය හැර ගිය දින සිට නැවත සේවයට වාර්තා කරන දින දක්වා කාලය සියලු දීමනා හා වැටුප් සහිතව නැවත සේවයේ පිහිටුවිය යුතුය.

02. පැමිණි කරුට සිය ඉහළ බලධාරීන් වෙතින් අසාධාරණයක් සිදු වී ඇති බව පැමිණිල්ලේ කරුණු අනුව අනාවරණය වන බැවින් හා එය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නිර්දේශයේදි පිළිගෙන ඇති බැවින් එම වගඋත්තර පාර්ශවයන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කටයුතු කළ යුතුය.

2019. 09-16 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/